මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ - I කොටස - 2018

-----------------------------------------------------------

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ - I කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

2015 ජුලි 08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණයට අනුව, මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම් කටයුතු එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ලෙස හැඳින්වෙන වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිළිවෙලින් ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කොටස් 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර කඩවත සිට මීරිගම දක්වා අධිවේගී මාර්ගයේ කි.මී. 36.59 ක ඉදිකිරීම් කටයුතු ව්‍යාපෘතියේ I කොටස යටතේ සිදු කරනු ඇත. කඩවත සිට මීරිගම දක්වා අධිවේගී මාර්ගයක් ඉදිකිරීමෙන් දැනට පවතින අධිවේගී මාර්ග ජාලය කි.මී. 36.59 කින් ව්‍යාප්ත කිරීම මගින් කලාප අතර ඉහළ සංචලතාවයක් ඇති කිරීම තුළින් ආරක්ෂාව වැඩි කිරීම මෙන්ම ගමන් කාලය, රථවාහන තදබදය, වාහන මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සහ පරිසර දූෂණය අඩු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 196,174 ක් වන අතර ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 29 දින ආරම්භ කරන ලද අතර 2020 අගෝස්තු 31 වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරනනේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ ව්‍යාපෘතිය නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අතුරු ගෙවීම් සහතික (IPC) ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රගති වාර්තාවේ සඳහන් සිවිල් වැඩ වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. | වත්කම් හා වගකීම් අවතක්සේරු වීම. | එකඟ වේ. | ව්‍යාපෘතිය සඳහා දරන ලද සත්‍ය පිරිවැය හා බැරකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ සිවිල් වැඩ 2016 දෙසැම්බර් 26 දින සිට ක්‍රියාත්මක කර තිබුණද, ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ යටතේ සිවිල් වැඩ සඳහා වන වියදම් දක්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ සත්‍ය වත්කම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | වත්කම් හා වගකීම් අවතක්සේරු වීම. | සිවිල් වැඩ සඳහා වන පිරිවැය ගිණුම්ගත නොකිරීම සඳහා බලපෑ හේතු පහත දැක්වේ.<br>1. ගිවිසුමේ (5) වගන්තියට අනුව කොන්ත්‍රාත්කරු සිය පුද්ගලික ධනයෙන් මූලික කටයුතු ක්‍රියාත්මක කර තිබීම.<br>2. කොන්ත්‍රාත්තුව ආරම්භ කර නොමැති බැවින් උපදේශක / සේවා යෝජකයා විසින් සිදු කරන ලද වැඩ සහතික කළ නොහැකි වීම.<br>3. කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීම දන්වා නොමැති බැවින්, කිසිදු වැඩක් සහතික කළ නොහැකි වීම.<br>4. ගිවිසුමේ (8) වගන්තියට අනුව, වැඩ ආරම්භ කිරීමට දන්වා නොතිබීම. | ව්‍යාපෘතියේ තථ්‍ය පිරිවැය සහ ගෙවිය යුතු බැරකම් ගිණුම්ගතකර මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |
| (ඇ) | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කොටස් හතර සඳහාම අදාළ ශක්‍යතා අධ්‍යයනය සඳහා රු. මිලියන | වත්කම් හා වගකීම් අවතක්සේරු වීම. | මෙම වියදමෙන් මෙම ව්‍යාපෘතිය සඳහා අදාළ කොටස ගිණුම්ගත කිරීම සඳහා අමාත්‍යාංශයේ උපදෙස් | ව්‍යාපෘතිය සඳහා දරන ලද සත්‍ය පිරිවැය හා ගෙවියයුතු බැරකම් ගිණුම්ගත කළ යුතුය. |

| | |
|---|---|
| 2,193 ක් වැය කර තිබුණද, එම වියදමෙන් මෙම ව්‍යාපෘතියට අදාළ කොටස වෙන් කර නොතිබුණි. එම නිසා ව්‍යාපෘතියේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ලැබෙන තුරු අපි බලා සිටිමු. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්

| අංකය | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 24 දිනැති අංක. 1/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී ආධාරකරුගෙන් අරමුදල් ලබා ගැනීම සඳහා ගිවිසුමක් හෝ අවම වශයෙන් සහතිකවීමක් හෝ නිශ්චිතභාවයක් තිබිය යුතු වුවද, ව්‍යාපෘතිය එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර 3 කට ආසන්න කාලයක් අරමුදල් සැපයීම සඳහා ආධාරකරුවෙකු හඳුනා නොගෙන ව්‍යාපෘතිය තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. මිල ඉහලයාම සහ අමතර පොදු කාර්ය පිරිවැය හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය විශාල ලෙස ඉහළ යාමට මෙම තත්ත්වය හේතුවනු ඇත. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමෙන් තොරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නඩත්තු කිරීම සඳහා අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුවීම. | ණය ගිවිසුම 2019 මාර්තු 22 දින අත්සන් කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබිය යුතුය. |
| (ආ) | 2015 දෙසැම්බර් 29 දිනැති අංක. 06/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛය. | නිමැවුම වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද, 2018 වර්ෂය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහ ව්‍යාපෘති | ව්‍යාපෘතියේ සත්‍ය ප්‍රගතිය ඇගයීමට නොහැකි වීම සහ අනවශ්‍ය ප්‍රමාදයන් සහ පිරිවැය දැරීමට | එකඟ වේ. අපි සටහන් කරගතිමු. චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් අනුව 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරිත්වය සඳහා තීරණාත්මක පිවිසුමක් සකස් කර නොතිබුණි. | නිසි සිදුවිය හැකිය. | | සකස් කිරීමට අපි ඉක්මණින්ම කටයුතු කරන්නෙමු. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| --------- | ---------------------- | -------- | ------------------- | ---------- |
| අධිවේගී මාර්ග ඉදිකිරීමේ නිර්මාණ කටයුතු. | ලංකා බැංකුව සමඟ ඇතිකරගත් මූල්‍ය එකගතාවයක් යටතේ නිර්මාණ සහ ඉදිකිරීම් අධීක්ෂණ කොන්ත්‍රාත්තුව බද්ධ ව්‍යාපාර සමාගමකට රු.මිලියන 2,549 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, භූ තාක්‍ෂණික පරීක්ෂණ, සවිස්තරාත්මක ව්‍යුහාත්මක සැලසුම් නිර්මාණය සහ පරීක්ෂණ ෆයිල් බැස්සවීම යනාදිය පමණක් 2018 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර තිබුණි. | අනවශ්‍ය ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | එකඟ වේ. | නිර්මාණ කටයුතු වේගවත් කිරීම සඳහා පියවර ගත යුතුය. |

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ------- | --------------------- | --------- | ---------------------------- | --------------- |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව 2015 ජූලි 06 දින කැබිනට් තීරණය මත පදනම්ව රු.මිලියන 158,386 ක මුදලකට පැකේජ 1 සහ පැකේජ 2 හි කොන්ත්‍රාත්තු පිළිවෙලින් 2016 ජුනි 20 සහ 2015 අගෝස්තු 04 යන දිනවල චීන ඉදිකිරීම් සමාගමකට ප්‍රදානය කර තිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය ඇගයීම් නොකිරීම ව්‍යාපෘතියේ ගුණාත්මක භාවයට හානි විය හැකිය. | මෙය අනායාචිත යෝජනාවක් (Unsolicited Proposal) බැවින්, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ II කොටසෙහි මූලධර්ම අදාළ කරගෙන තිබුණි. | ඉදිකිරීම් කාලය තුළ කොන්ත්‍රාත්කරුගේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මුලදී, පොතුහැර සිට රඹුක්කන දක්වා වූ ව්‍යාපෘතියේ 3 වන කොටස ඉදිකිරීමට Metalogical Corporation of China ආයතනය සමඟ ගිවිසුම අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, එකඟ වූ මාස හයක කාලය තුළ ණය ලබා දීමට ඔවුන්ට නොහැකි වූ බැවින් එය බලරහිත | කොන්ත්‍රාත් ප්‍රදානය ඇගයීම් නොකිරීම ව්‍යාපෘතියේ ගුණාත්මක භාවයට හානි විය හැකිය. | මෙය අනායාචිත යෝජනාවක් (Unsolicited Proposal) බැවින්, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ II කොටසෙහි මූලධර්ම අදාළ කරගෙන තිබුණි. | ඉදිකිරීම් අතරතුර කොන්ත්‍රාත්කරුගේ වැඩ අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ගිවිසුමක් ලෙස අවලංගු කර තිබුණි. එබැවින්, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කරන ලද **2015** ජූලි **06** දිනැති අංක. **15/1021/602/040** දරන කැබිනට් සංදේශයට අනුව, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් අනුගමනය නොකර **3** වන කොටසේ ප්‍රරම්භක කටයුතු වලදී කොන්ත්‍රාත්කරු විසින් දරනු ලැබූ වියදම පියවා ගැනීමේ විසඳුමක් ලෙස ප්‍රසම්පාදන අස්ථිතිත්වය විසින් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ **1** වන කොටස ප්‍රදානය කර තිබුණි. | | | |
| (ඇ) | පවතින තොරතුරුවලට අනුව, පිටත වටරවුම් මාර්ග-**3** හි ඉතිරිකිරීම් මගින් කඩවත සිට කොස්සින්න දක්වා වූ පැකේජ - **1** හි ඉදිකිරීම් කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය තීරණය කර තිබුණු අතර අවසානයේදී කඩවත අන්තර් හුවමාරුව සහ පැකේජ - **1** හි කි.මී. **0.5** ක දුරක් සම්පූර්ණ කිරීමට තීරණය විය. කෙසේ වෙතත්, පිටත වටරවුම් මාර්ග-**3** හි ඉතිරිකිරීම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එය ක්‍රියාත්මක කර නොතිබුණි. | මූල්‍ය ගිවිසුමට අනුව ඉදිකිරීම් සැලසුම් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය අනවශ්‍ය ලෙස වැඩි වීමට ඇති හැකියාව. | එකඟ වේ. පිටත වටරවුම් මාර්ග-**3** ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් වන තුරු දෙවන යෝජනාව ක්‍රියාත්මක වීම ප්‍රමාද වේ. | අපේක්ෂිත මූල්‍ය ගිවිසුම සමඟ ඉදිකිරීම් සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ. |
| (ඈ) | මූලික ගිවිසුමට අනුව, වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා චීනයේ EXIM බැංකුවෙන් ණයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය අදහස් කළ අතර ගිවිසුම අත්සන් කළ දින සිට දින **365** ක් ඇතුලත වැඩ ආරම්භ නොකළහොත් ශ්‍රී ලංකා රජය සහ චීනයේ EXIM බැංකුව අතර අත්සන් කළ ණය ගිවිසුම ස්වයංක්‍රීයව අවසන් වේ. කල් ඉකුත්වීම හේතුවෙන් **01** | අනවශ්‍ය ප්‍රමාදය නිසා ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යාමට ඇති හැකියාව. | ණය ගිවිසුම **2019** මාර්තු **02** දින අත්සන් කර ඇති බැවින් අවදානමක් නොමැත. | අපේක්ෂිත මූල්‍ය ගිවිසුම සමඟ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඇගයීමට ලක් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පැකේජය 06 වතාවක් ද 02 පැකේජය 08 වතාවක් ද දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මගින් එවැනි මූල්‍ය අවදානම් අවම කිරීමට පියවර ගෙන නොතිබුණි. | | | |
| (ඉ) | ගිවිසුම් නීතියට අනුව, වලංගු ගිවිසුමක් ඇති කිරීම සඳහා අර්පණය, ප්‍රතිග්‍රහණය සහ නීත්‍යානුකූල බැඳීම වැනි අංග 3 ක් තෘප්තිමත් වීම අවශ්‍ය වනු ඇත. කෙසේ වෙතත්, ප්‍රතිග්‍රහණ ලිපිය සේවායෝජකයා විසින් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිකුත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොන්ත්‍රාත්කරු සහ මාර්ග සංවර්ධන අධිකාරිය අතර 2016 ජුනි 20 සහ 2015 අගෝස්තු 04 දින සකස්කර අත්සන් කරන ලද පිළිවෙලින් 1 සහ 2 පැකේජ සඳහා වූ ගිවිසුම් වලංගු ගිවිසුම් නොවීය. එබැවින්, ලංසු ආකෘතිය ප්‍රකාරව නියම කර ඇති කාර්ය සාධන බැඳුම්කරය කොන්ත්‍රාත්කරු විසින් 2018 වර්ෂය අවසානය දක්වා ඉදිරිපත් කර නොතිබුණි. | කාර්ය සාධන බැඳුම්කරය නොමැතිවීම නිසා අමතර අවදානමක් ඇතිවිය හැකිය. | සාමාන්‍යයෙන්, ප්‍රතිග්‍රහණ ලිපිය යනු කොන්ත්‍රාත්කරු සමඟ ඇතුළත් වූ මූලික ගිවිසුමක් වන අතර එය කොන්ත්‍රාත් ගිවිසුමේ කොටසක් වේ. ප්‍රතිග්‍රහණ ලිපිය නොසළකා හැරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම කෙලින්ම අත්සන් කළ හැකි නම් එය වඩාත් නීත්‍යානුකූල වනු ඇත. නිශ්චිත කාර්ය සාධන කාල සීමාවක් නොමැති බැවින් කාර්ය සාධන බැඳුම්කරයේ අවශ්‍යතාවයක් නොමැත. | කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුව කාර්ය සාධන බැඳුම්කරය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසිවල 4.2 උප වගන්තියට අනුව කොන්ත්‍රාත්තුවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා කොන්ත්‍රාත්කරු තමාගේ වියදමින් කාර්ය සාධන බැඳුම්කරයක් ලබා ගත යුතු වුවද, ව්‍යාපෘතිය විසින් ඉහත අවශ්‍යතාවයට පටහැනිව ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ඇතුළත් කර තිබුණි. අතිරේක වියදම්වල ප්‍රතිඵලයක් ලෙස පැකේජ 1 සහ 2 සඳහා | කොන්ත්‍රාත්කරුවන්ට අයුතු වාසියකි. | ඔහුගේ වියදමින් කාර්ය සාධන ඇපකරයක් ලබා ගැනීම සඳහා කොන්ත්‍රත්තුවේ කොන්දේසිය මගින් පැවසුවද, කොන්ත්‍රාත්කරු විසින් ලංසු තැබීම සඳහා ප්‍රමාණ පත්‍රවල වෙනම කොන්දේසියක් දක්වා තිබුණි. ඉහත සංකල්පයට හේතුව, කාර්යසාධන බැඳුම්කරයේ පිරිවැය වෙනම ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුට ඉඩ | වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| පිළිවෙලින් රු.මිලියන 64 ක් සහ රු.මිලියන 741 ක් ප්‍රමාණ පත්‍රවල ඇතුළත් කර තිබුණි. එබැවින් අනාගතයේදී එය කොන්ත්‍රාත්කරුට අයුතු වාසියක් ලබාදීමක් වනු ඇත. | නොදෙන්නේ නම්, සැඟවු ගාස්තුවක් වන එය ඔහු විසින් අයිතමයන්ට ඇතුළත් කරනු ඇති අතර අයිතමවල පිරිවැය අසාමාන්‍ය ලෙස ඉහළ යාමෙන් එකගතාවයකට පැමිණීමට නොහැකි වනු ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණයට අදාළ ගැටළු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය -1 යටතේ සේවය කරන ඉංජිනේරුවන්, සංවර්ධන නිලධාරීන්, නැවත පදිංචි කිරීමේ සහායකයින් සහ කළමනාකරණ සහායකයින් වැනි තනතුරු සඳහා ව්‍යාපෘතිය විසින් යොමුකිරීමේ අනුදේශ (TOR) සකස් කර නිකුත් කර නොතිබුණි. එබැවින් ඔවුන්ගේ කාර්යසාධනය සහ ව්‍යාපෘතිය සඳහා කරන ලද දායකත්වය නිරීක්ෂණය කළ නොහැකි වනු ඇත. | නුපුහුණු සේවකයින්ගේ මැදිහත්වීම නිසා පාඩු සිදුවීමට ඇති හැකියාව. | සියලුම කාර්ය මණ්ඩලය අදාළ තනතුරු සඳහා පත් කරන විට අපි දැනටමත් රාජකාරි ලැයිස්තුවක් ලබා දී ඇත්තෙමු. අනාගතයේ දී ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය සහ ව්‍යාපෘතියට ලබා දෙන දායකත්වය ඇගයීමට ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු. | නිසි යොමුකිරීමේ අනුදේශ තිබිය යුතු අතර ඒ අනුව කාර්ය සාධනය ඇගයීම සිදු කළ යුතුය. |